ව්‍යවසායකත්ව ඇසුරෙනි. හොඳින් පවත්වාගෙන ගිය ගී කියන කන්දේවත්ත නම් තේ සහ රබර් වත්තක් ඔහු සතුවිය. එය හොරණ, බුලත්සිංහල හා අගලවත්ත යන මැතිවරණ කොට්ඨාස තුන පුරා විහිදී තිබිණි. රොනීද මන්ත්‍රීවරයකු වූ 1970-77 සිරිමා බණ්ඩාරනායක රජයේ ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ යටතේ ඔහුට අක්කර 50ක් පමණක් ඉතිරි කොට ඔහුගේ වතුයාය ජනසතු කෙරිණි. වතු කොම්පැණි රජයට පවරා ගැනීමේ කොන්දේසිය වූයේ එයයි. පෙර හිමිකරුවාට අයිති වූයේ අක්කර 50ක් පමණි. තමාගේ කැමැත්තෙන්ම අක්කර 4000ක් තමා රජයට භාරදුන් බව රොනී කිවේය. ඒ වනවිට ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රතිසංස්කරණයේ අවශ්‍යතාව ඔහු පිළිගෙන තිබීම ඊට හේතුවයි. වතු ජනසතු කිරීමේ (ජාතිකකරණයේ) නිර්මාතෘවරයා වූ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා බවට පත් ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මෙන්ම ඔහු ද වතු අංශය ශ්‍රී ලංකාවේ ජාතික සම්පතක් බව විශ්වාස කළේය. කිසිම අයුරකින් ඒවා කැබලි කඩා, එවැනි වැඩ පිළිවෙළ යටතේ පොළොව කොටන්නන්ට බෙදා දිය යුතු නැති බවද ඔහු විශ්වාස කළේය.

ඔහුගේ විශ්වාසය වූයේ ඒවා පෞද්ගලික හිමිකාරිත්වයට වඩා පොදු අයිතිය යටතේ පවතින විට වඩාත් කාර්යක්ෂම ලෙසත් ඉහළ නිෂ්පාදන ධාරිතාවකින් යුක්තව ඵලදායි ලෙසත් පවත්වාගෙන යා හැකි වේය යන්නයි. එහෙත් පසුව සි දු වූ සිද්ධිවලින් රොනී වැරදි බව සනාථ වුවේය. ජනසතු කරනු ලැබූ වතු වඩාත් ඵලදායි වනු වෙනුවට ඒවා බදු ගෙවන්නනට බරක් බවට පත්වී දුර්වල කළමනාකරණය හේතුවෙන් දිගින් දිගටම පාඩු ලබන තත්වයට පත් වූයේය. එම නිසා තමාට ඉතිරි වූ අක්කර 50, ජන සතු කළ වැවිලිවලට ආදර්ශය සපයන ගොවි පොළක් ලෙස සංවර්ධනය කොට පෙන්වූයේය. ඔහු මුදල් අමාත්‍යවරයා බවට පත් වූ විට ගී කියන කන්ද වතුයායේ ශාන්ත පරිසරය අත් විඳිමින් වාර්ෂික අයවැයට අදාළ අවසාන පිරියම් කරන්නට පුරුදුව සිටියේය.

## ආර්ථික විද්‍යාව ඉගෙනීමේ මහත් උනන්දුව

රොනී ඉතිහාස ශිෂ්‍යයකුව සිටිය ද හෙතෙම ආර්ථික විද්‍යාව ඉගෙන ගන්නා ශිෂ්‍යයෙක් ද වූයේය. 1979 මහ බැංකු අධිපති වර්ණසේන රාසපුත්‍ර, මා ඔහුගේ කාර්යාලයට කැඳවා රොනී, වොල් ස්ට්‍රීම් ජර්නල්, ඉකොනොමිස්ට් නිව්ස් වීක්, Far Eastern Econmic Review ආදී සියලුම නවතම සඟරා කියවමින් විශේෂයෙන් ශ්‍රී ලංකාවට බලපාන අලුත්ම ගෝලීය ආර්ථික ප්‍රවනතා ගැන ඔහු සමග සාකච්ඡා කරන බව කී සැටි මට තවමත් සිහිපත් වේ. ඒ වනවිට මම ආර්ථික පර්යේෂණ අංශයේ, ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥයා ලෙස කටයුතු කළෙමි. එම සඟරා ලැබුණු විගස මා ඒවා කියවා ඔහු වෙත නවතම ප්‍රවනතා විස්තර කොට වාර්තා කරවීමට මහ බැංකු අධිපති වර්ණසේන රාසපුත්‍රට අවශ්‍ය විය. වර්තා කළ එම සටහන්වලින් සන්නද්ධව අදාළ තොරතුරු රොනී වෙත වාර්තා කරන්නට එවිට ඔහුට හැකි වූයේය. මම පණිවිඩ රොනී ඉතා බැරෑරුම් ලෙස ගෙන ශ්‍රී ලංකාවට ඒවායින් සිදුවිය හැකි අහිතකර බලපෑම් කල් තියා වළක්වා ගන්නට අවශ්‍ය සැලසුම් යෙදුවේය.

ඉකොනොමිස්ට් සඟරාවේ, සෝවියට් සමුහාණ්ඩුවේ එම වසරේ ධාන්‍ය අස්වැන්න පහත වැටීම සම්බන්ධයෙන් පළවූ එක්තරා වාර්තාවක් බෙහෙවින් වැදගත් විය. කැනඩාවෙන් එවර සෝවියට් දේශයට තිරිඟු ආනයනය කරන්නට සිදු වූ නිසා ඒ සඳහා ඩොලර් ගෙවන්නට තමන් සතුව තිබූ රන් සංචිත විකුණා දමන්නට සෝවියට් දේශයට සිදුවිය. එයින් කාරණා දෙකක් ගම්‍ය විය. එකක් නම් සැපයුම වැඩි වීම නිසා වෙළෙඳපොළේ රත්‍රන් මිල පහළ යා හැකි වීමයි. අනෙක අලුතෙන් ඇතිවන අමතර ඉල්ලුම නිසා තිරිඟු මිල ඉහළ යා හැකි වීමයි. තමන්ගේ කැබිනට් සගයා වූ ලලිත් ඇතුලත් මුදලිට, රටේ ඇතිවිය හැකි අමතර තිරිඟු පිටි තොග කල් තියා මිලදී ගන්නා ලෙස රොනී උපදෙස් දුන්නේය.

## ග්‍රාමීය ජනතාවට මූල්‍ය සේවා

රොනීට මහබැංකුවේ හොඳ මිතුරෙක්ව සිටියේය. ඒ වර්ණසේන රාසපුත්‍රය. රාසපුත්‍ර 1940 ගණන්වල ආ ලංකා විශ්වවිද්‍යාලයේ සිටි ඔහුගේ සමාකාලීනයෙකි. දෙදෙනා එකිනෙකා වෙත ගෞරව දැක්වූහ. මහ බැංකු අධිපතිවරයා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යටපත් කරමින් අමාත්‍යවරුන්ට විරුද්ධත්වය පාන්නටද උත්සාහ දරන අද දවසේ මෙන් නොව රොනී මහ බැංකුවට සවන් දීමට කැමැත්තෙන් සිටියේය. 1980 ගණන්වල උද්ධමනය සියයට 22ටත් වඩා ඉහළ ගිය එක් අවස්ථාවක් මගේ මතකයට එයි. එවර පොලී අනුපාත ඉහළ දමමින් සහ වාණිජ බැංකුවලට උපරිම ණය සීමා පනවමින් මහ බැංකුව ක්ෂණික ප්‍රතිපත්තිමය පිළියමකට එළැඹුණේය. නිරන්තයෙනන් අංක එකේ ජන හතුරා වන වැඩිවන උද්ධමනය මැඩලීමට අතිශය සීමාකාරි මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට රාසපුත්‍රට රොනීගේ පූර්ණ සහාය ලැබුණේය.

ගොවීන්ට සහ ග්‍රාමීය ව්‍යවසායකයන්ට ණය ලබාදීම තහවුරු කරලීමට දෙදෙන අලුත් ග්‍රාමීය බැංකු ක්‍රමයක් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු නමින් ක්‍රියාත්මක කළහ. එය ඉන්දියාවේ ග්‍රාමීය සංවර්ධන බැංකුවලට අනුරූප වූවකි.

Sanka Law Professional Corporation



"Cost effective legal advice in a timely manner"

- Real Estate
- Family Law
- Wills, Powers of Attorney and Estates
- Business Law
- Notary Public Services

Sanka Wijeratne, LL.B.
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC

OFFICE
50 Nashdene Road
Unit 104
Toronto ,ON M1V 5J2
Tel: 416-494-9183
Fax 1 866 494 9389

E mail : info@sankalaw.com Web : http://www.sankalaw.com

Services are available in Sinhala, Tamil (by appointment only) and English. Evening and weekend appointments are available.